*සැ.යු.:* 2025.08.29 දින පළ කරන ලද අංක 2452 *ගැසට්* පත්‍රයේ III හා IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,453 - 2025 සැප්තැම්බර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2025.09.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 958 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... ... | 961 |
| මිල පාලන දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... ... | 967 |
| නැවියන්ට දැන්වීම් ... ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 සැප්තැම්බර් මස 26 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් මස 12 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

957 - B 82716 - 755 (2025/09)
E - 01

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

MOD/DEF/HRM/04/SLN/AMDS/09.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික බලකාය**

ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ජ්‍යෙෂ්ඨතාවය සංශෝධනය කිරීම

*2021 ජූලි මස 03 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (නාපාබල) වශයෙන්*:

ලුතිනන් කොමාණ්ඩර් (නාපාබල) වාසල ලියනගේ සමින්ද නානායක්කාර, එන්ආර්අයි 2599, ශ්‍රීලංනාභ.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්),
ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී
(උපායමාර්ගික අධ්‍යයන - චීනය),
එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන),
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2025 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

09 - 01/1

---

MOD/DEF/HRM/04/SLN/RES/25/(08).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2025 ජුනි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායේ අධිකාරියෙන් ඉවත් කිරීම ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් රත්නායක මුදියන්සේලාගේ කාවින්ද නුවන්ප්‍රිය රත්නායක, එන්ආර්එක්ස් 4191, ශ්‍රීලංනාභ.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්),
ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී
(උපායමාර්ගික අධ්‍යයන - චීනය),
එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන),
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2025 ජුනි මස 26 වැනි දින,
කොළඹ දී ය.

09 - 01/2

---

2025 අංක 592

MOD/DEF/HRM/04/SLN/COM/25/(04).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

*2020 ජූලි මස 16 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන්*:

මධ්‍ය නිලධාරි දෝන ෂෙහාරා මියුකි දෙමටගොඩ, එන්ආර්එම් 4316, ශ්‍රීලංනාභ;

මධ්‍ය නිලධාරි අත්තනායක මුදියන්සේලාගේ අකේෂි නිම්තරා අත්තනායක, එන්ආර්එම් 4318, ශ්‍රීලංනාභ;

මධ්‍ය නිලධාරි රාජතේජ පතිරන්නැහැලාගේ ශ්‍රීනාත් ඉඳුනිල් රත්නවීර, එන්ආර්එම් 4325, ශ්‍රීලංනාභ;

මධ්‍ය නිලධාරි ඕෂධ විහඟ වික්‍රමආරච්චි, එන්ආර්එම් 4326, ශ්‍රීලංනාභ;

*2020 ජූලි මස 30 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන්*:

මධ්‍ය නිලධාරි ජීවරාසා අමුදාංගන්, එන්ආර්එම් 4339, ශ්‍රීලංනාභ;

*2020 සැප්තැම්බර් මස 14 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන්*:

මධ්‍ය නිලධාරි සිංහලගේ සඳලි රන්දිකා වික්‍රමසිංහ, එන්ආර්එම් 4342, ශ්‍රීලංනාහ;

*2020 ඔක්තෝබර් මස 15 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන්*:

මධ්‍ය නිලධාරි උයන හේවාගේ විමුක්ති තමෝනුද, එන්ආර්එම් 4343, ශ්‍රීලංනාහ;

*2020 නොවැම්බර් මස 20 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන්*:

මධ්‍ය නිලධාරි ප්‍රනීත් වමෝද්‍යා මුණසිංහ, එන්ආර්එම් 4167, ශ්‍රීලංනාහ;

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්),
ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී
(උපායමාර්ගික අධ්‍යයන - චීනය),
එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන),
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී,
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2025 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

09 - 01/3

---

2025 අංක 593

MOD/DEF/HRM/04/SLN/RES/25/(09).

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම

පහත නම සඳහන් නිලධාරියා 2025 ජුනි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම ගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

වැඩ බලන ලුතිනන් වීරවර්ධන පතිරන්නැහැලාගේ කවිඳු ජිතේන්ද්‍ර වීරවර්ධන, එන්ආර්එක්ස් 3753, ශ්‍රීලංනාහ.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්),
ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී
(උපායමාර්ගික අධ්‍යයන - චීනය),
එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන),
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී,
ලේකම්,
ආරක්‍ෂක අමාත්‍යාංශය.

2025 ජූලි මස 20 වැනි දින,
කොළඹ දී ය.

09 - 01/4

---

2025 අංක 594

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් ආධුනික නිලධාරි/නිලධාරිනීන් දක්වා ඇති ජ්‍යෙෂ්ඨත්වය අනුව ජාතික ශිෂ්‍යභට බලකායේ අධිකාරියට පත්කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළකර ඇත.

*2024 පෙබරවාරි මස 01 දින සිට දෙවන ලුතිනන් වශයෙන්*:

01. මීරා සාහිබු රකීම්

*2024 මාර්තු මස 15 දින සිට දෙවන ලුතිනන් වශයෙන්*:

01. සිවර්මලර් තිරුනරෙයිවෙල්වන් (ගැ)
02. කඳුබොඩ දිසා බංඩාර මුදියන්සේලාගේ සවිඳු විමංශ හරිතදේශ
03. තැන්නේකුඹුරේ ගෙදර නුවන් ප්‍රියන්ත බණ්ඩාර රණසිංහ
04. උඩගේ මහකුඹුරේ හර්ෂණී කාංචනා රත්නායක (ගැ)
05. හෙට්ටිආරච්චි කංකානමලාගේ යශෝධා තරංගනී හෙට්ටිආරච්චි (ගැ)
06. දසනායක ආරච්චිල්ලාගේ ශවින්ධ්‍යා ද සොයිසා සිරිවර්ධන (ගැ)
07. ආනන්ද පතිරන්නැහැලාගේ මල්ෂා හංෂිණී පතිරණ (ගැ)
08. වීරකෝන් මුදියන්සේලාගේ බුද්ධික පුෂ්පකුමාර වීරකෝන්

09. රාජපක්ෂ චන්දන ප්‍රියදර්ශන
10. රවිචන්ද්‍රන් විනෝද්
11. මාරසිංහ ආරච්චිලාගේ නිමාලි ප්‍රියදර්ශනී මාරසිංහ (ගැ)
12. සුබද්‍රා දූරගේ තුෂාර ලක්ෂිත මධුෂාන්
13. දේසිං රත්නායක චානක ධනංජය
14. මයිකල් ශාන්තිකා (ගැ)
15. මුතුගල් පේඩිගේ තිලංකා රොෂානි මධුමාලි (ගැ)
16. විජේසුන්දර ආරච්චිගේ ලක්ෂිකා හිරුෂි නයනාංගනී (ගැ)
17. තිරමුණි මාලිත ප්‍රමෝද්‍යා සේනාරත්න
18. අංහෙට්ටිගම ගමරාළලාගේ ලක්මිනි සාගරිකා සුමනදාස (ගැ)
19. ලියනගේ සහන් මාලින්ද විජේසූරිය
20. හේරත් මුදියන්සේලාගේ මිහිරි භාග්‍යා හේරත්(ගැ)
21. පෝරගේ දෝන සුගන්දිකා ජීවන්ති (ගැ)
22. රෙජිනෝල්ඩ් දිනේස් කුමාර්
23. මුත්තෙට්ටු කනත්තේ රුචික කෞශල්‍යා පත්මානන්ද
24. හේරත් මුදියන්සේලාගේ සමිත ප්‍රියදර්ශන අබේකෝන්
25. අලගිය හේවාගේ වාසනා සුපුන් රත්නසිරි
26. වීරකෝන් මුදියන්සේලාගේ පුබුදු සඳරුවන් කුමාර
27. විතානගේ ලහිරු දිල්ශාන්
28. බ්‍රහ්මචාරිගේ නුවන් මධුසංක
29. පසන් මධුසංක අබේනායක
30. මයිල්වාගනම් ධනුෂිකා (ගැ)
31. මොහොමඩ් රාෆි මොහොමඩ් රෆ්කාන්
32. කාරියවසම් බෝවිතන්ත්‍රී පවිත්‍රා පියුමලී (ගැ)
33. ගුණරත්න අධිකාරි මුදියන්සේලාගේ සාරිකා තේජානි (ගැ)
34. ඉන්තුෂා තනුෂාන් (ගැ)
35. කුමාරසිංහ හෙට්ටිආරච්චිලාගේ ධම්මික සඳරුවන් කුමාරසිංහ
36. පරණ ලියනගේ පමෝද් හර්ෂණ
37. ජෝන් ජිනරත්න මාලගේ අමාලි මිහිරංගා රූපසිංහ (ගැ)
38. අසරප්පුලිගේ රිද්මි නිදර්ශනා (ගැ)
39. මොහොමඩ් අන්වර් කාන් අර්ෂද්
40. කහඳවල ආරච්චිලාගේ ඉෂංඛා අංජානි (ගැ)
41. විජේසූරිය ආරච්චිගේ තාරිකා කෞෂිනි (ගැ)
42. යෝගනාදන් තියාගරාජන්
43. සත්‍යමූර්ති නිතිලන්
44. කුලන්දවේල් සිවනේෂන්
45. කරුණාතිලකගේ සජානි ස්වර්ණමාලි බාලසූරිය (ගැ)
46. රාමසාමි සතිශ් කුමාර්
47. ශ්‍රී නාරායන බ්‍රාහ්මණ මුදියන්සේලාගේ ජනිත් කාවින්ද සේනානායක
48. ඉෂානි කෞෂල්‍යා කළුආරච්චි (ගැ)
49. වෙලේ ගෙදර තාරක බණ්ඩාර තිලකරත්න
50. ජෝසුවා දර්ශනී (ගැ)
51. තරුකා මල්ෂාන් ලියනආරච්චි
52. ගනේගොඩගේ පවන් මධුෂාන් ගනේගොඩ
53. කංකානම් පතිරණගේ දනුස්ක මදුසංඛ
54. රාජේන්ද්‍රන් ප්‍රබාලනී (ගැ)
55. චාල්ස් විජයරත්නම් ස්ටාලින් කැමිලස්
56. වර්ණකුලසූරියගේ සමන්තිකා කුමාරි රණවීර (ගැ)
57. කඩවතගේ චින්තන මධුෂාන් ආරියරත්න
58. පුංචි කුමාරගේ අනුෂා නිශාන්ති (ගැ)
59. පොල්වත්තේ ගෙදර රාජපක්ෂ වාසල මුදියන්සේලාගේ චතුරංග ප්‍රභාස් වීරකොටුව
60. රාසේන්ද්‍රන් ශ්‍රී දරන්
61. වැරණියගොඩ මුදියන්සේලාගේ ගයාෂිණී දිල්හාරා මධුශාන්ත (ගැ)
62. ආනන්ද රාසා ආනන්ද නිරෝෂන්
63. කලන්දර් ලෙබ්බෙ අමානුල්ලා
64. රත්නායක හිටිහාමිලාගේ විමන්ත ඔෂාද්
65. මොහොමඩ් ෆුවාර්ඩ් අහමඩ් රීෆා ෆුවාර්ඩ්

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්),
ආර්එස්පී (දෙවරක්), යූඑස්පී, එම්එම්එස්සී
(උපායමාර්ගික අධ්‍යයන - චීනය),
එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්එස්සී (ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන),
එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2025 ජූලි මස 21 වැනි දින,
කොළඹ දී ය.

09 - 02

# රජයේ නිවේදන

## 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත 1973 අංක 41 දරන පනත 1978 අංක 19 දරන පනත ආදී සංශෝධිත පනත් වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥාපනතේ 25(1)26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුභාෂිණී දයානන්ද,
ලේකම්,
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2025 සැප්තැම්බර් මස 03 වැනි දින.
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව,
අංක 35ඒ,
ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (01) 46091 | හේවාගේ දොන් නන්දන සිරිවර්ධන මයා, "නන්දන" මඩවලවත්ත, කොළැහැගඩ, නමුත්තුඩුව, මතුගම. | තනි ආරච්චිගේ දොන් චමින්ද නිසාන්ත සිරිවර්ධන මයා මනාන හංදිය, කොළැහැගඩ, නමුත්තුඩුව, මතුගම. |
| (02) 46568 | කලු ආරච්චිගේ දෝන කල්‍යානණි ස්වර්ණලතා, අංක 62/3, විජය ගුණරත්න වත්ත, අංගංගොඩ, පයාගල. | පුස්සවල හේවගේ ෂෙහාන් නදීෂ මයා අංක 78, යොවුන්ගම, හල්කඳවිල. |
| (03) 43687 | දෝන අයිරින් මල්ලවආරච්චි මිය, අංක 87, ජනතා මාවත, නාවින්න, මහරගම. | චන්ද්‍රසේකර මුදියන්සේලාගේ මිරෝන් වසන්ත කුමාර බණ්ඩාර චන්ද්‍රසේකර මයා, අංක 18/A, පැරකුම් පෙදෙස, කොළඹ 08. |
| (04) 46668 | උඩහ වත්ත ආරච්චිලාගේ නිරෝෂන් පෙරේරා මයා 02. උඩහ වත්ත ආරච්චිලාගේ වින්සන් පෙරේරා. | දොන් ජුලියන් ප්‍රියන්ත රාමනායක මයා, අංක 346/2/C, පුවක්පිටිය, කිරිවන්දල. |
|  | 03. කඳුරුලියද්දගේ සෝමලතා, අංක 240, තල්දූව, අවිස්සාවේල්ල. |  |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (05)<br>46662 | ඉම්රාන් යකීම් මයා,<br>අංක 53/2 B, ප්‍රිය මාවත,<br>පිළියන්දල. | සී/ස ජගත් ඉන්වෙස්මන්ට් (පුද්) සමාගම,<br>අංක 486, ඕවිටිගල, මතුගම. |
| (06)<br>46682 | ඉනෝකා රංජනී විතානගේ,<br>අංක 607/56,<br>ද සිට් ජයන්ති පාර,<br>අතුරුගිරිය. | මැටරඹ කනත්තේ ගමගේ සුජිත් කුමාර මයා,<br>අංක 33/1, මහවිහාර පාර, ලක්ෂපතිය, මොරටුව, අබේවෙල. |
| (07)<br>46677 | අබේගොඩ ලියනගේ අනෝමා ප්‍රියදර්ශනි,<br>අංක 143/7, වෙනිවැල් කැටිය,<br>නාගොඩ, දොඩන්ගොඩ. | වටුතන්ත්‍රිගේ නාවනා දිව්‍යාංජලි ද සිල්වා මිය,<br>අංක 318/38B, පළමු පටුමග, ගොරකාන, කෙසෙල්වත්ත,<br>පානදුර. |
| (08)<br>46641 | තෙල්ගේ අසංක පුෂ්පකුමාර මයා,<br>අංක 22/A/4, එක්සත් පුරය,<br>ඔලබොඩුව, ගෝනපල හන්දිය. | බරනේඩෙට් කෲස් මයා,<br>අංක 22/B/2, එක්සත්පුරය,<br>ඔලබොඩුව, ගෝනපල හන්දිය. |
| (09)<br>46687 | අං හෙට්ටිගේ පිලික්ස් පෙරේරා මයා,<br>අංක 372/A, අලුබෝමුල්ල, පුරුක්ගොඩ,<br>රටියලගොඩ. | හේවාගේ සෝමචන්ද්‍ර පෙරේරා මයා,<br>අංක 276, හොරණ පාර, පමුණුගම, අළුබෝමුල්ල. |
| (10)<br>46670 | වීරසිංහ මුදියන්සේලාගේ ඉන්දික සඳකැළුම්,<br>අඳවෙලයාය, වැල්ලවාය. | ප්‍රියෝවින් ක්‍රෙඩිට් ඇන්ඩ් ඉන්වෙස්මන්ට් ලිමිටඩ්,<br>අංක 19/A, විජය පාර, ගම්පහ. |
| (11)<br>46679 | අරංගලගේ දොන් චන්ද්‍රසිරි මයා,<br>අංක 99/1, දම්පේ, මඩපාත, පිළියන්දල. | ජගත් ඉන්වෙස්මන්ට් පුද්ගලික සමාගම,<br>අංක 33, හොරණ, පිළියන්දල. |
| (12)<br>46664 | පුවක්කුට්ටි මුදියන්සේලාගේ විමලසිරි<br>හාමිනේ (මියගොස්)<br>1වි. ඒ උපාලි සරත්චන්ද්‍ර,<br>අංක 295/A, කෙලින් වීදිය,<br>කොස්ගම. | ප්‍රැන්සිස්ගේ දොන් ටියුරින් පෙරේරා මිය,<br>අංක 66/5, යටියන්තොට පාර,<br>අවිස්සාවේල්ල. |
| (13)<br>46702 | අම්පේ රාලලගේ මල්ලිකා සෙනරත්<br>අලහකෝන් මිය,<br>අංක 176/4, ගමගේවත්ත පාර, උඩුමුල්ල,<br>පාදුක්ක. | විජිත ෆිනෑන්ස් ලිමිටඩ්,<br>අංක 46, ඉංගිරිය පාර, පාදුක්ක. |
| (14)<br>46680 | බෙත්මගේ දෝන රම්‍යලතා මිය,<br>අංක 340/20, ගනේවත්ත පාර,<br>මාම්පේ, පිළියන්දල. | ජයමාපලගේ ජනක කුමාර මයා,<br>අංක 43, විචන් මන්න පාර, මාම්පේ, පිළියන්දල. |
| (15)<br>46693 | ගුණනන්දා හන්දිගේ සුනිල් සමරජීව,<br>අංක 207/2A, රණවිරු ප්‍රේමසිරි මාවත,<br>සියඹලන්ගොඩ,<br>පොල්ගස්විට. | සෙනරත් ආරච්චිගේ සමන් කුමාර මයා,<br>අංක 6/55, පොල්ගස්ඕවිට, මත්තේගොඩ. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (16)<br>46717 | ගුණනන්දා හන්දිගේ සුනිල් සමරජීව මයා,<br>අංක 207/2A,<br>රණවිරු ප්‍රේමසිරි මාවත,<br>සියඹලන්ගොඩ,<br>පොල්ගස්ඕවිට. | වීරසූරිය මහවත්තගේ කුලසේන ප්‍රභාත් මයා,<br>අංක 173/F,<br>නිදහස් සමරු මාවත, බොලකොටුව, ගම්මන්පිල, බණ්ඩාරගම. |
| (17)<br>46716 | කාරියප්පෙරුම විජේසුන්දර ඒකනායක මුදියන්සේරාලහාමිල්ලාගේ අශෝක ධම්මික ප්‍රනිත් යායින්න මයා.<br>අළුත් වලව්ව, යායින්න,<br>කහවත්ත. | ඩිංගිරි බණ්ඩලාගේ නිමල් දසනායක මයා,<br>කාවිලකන්ද, උඩුහව්පේ, කහවත්ත. |
| (18)<br>46737 | සුදූවා දේවගේ ශ්‍රියානි මිය,<br>අංක 139, රොක්ලන්වත්ත,<br>මාගල්කන්ද, මග්ගොන. | කුසේ කුරේ මොහොට්ටි ගුරුන්නාන්සේලාගේ මාර්ක් රංජිත් කුරේ මයා,<br>අංක 121 C, ලූෂන් ටයියන් ගම්මානය, මග්ගොන. |
| (19)<br>46709 | මද්දුමගේ විරන්ත මධුෂාන් ප්‍රනාන්දු මයා,<br>අංක 292, හේනවත්ත, දිබ්බැද්ද,<br>පානදුර. | දූනුමදිනගේ සදීකා හර්ෂානි ප්‍රනාන්දු මිය,<br>අංක 22, සෙන්දික් පෙදෙස, කටුකුරුන්ද, මොරටුව. |
| (20)<br>46697 | හොරවල විතානගේ මාලනි මිය,<br>මද්දුමගේ සමරසිරි,<br>අක්කර 10, මැණික්ගොඩ,<br>නවුත්තුඩුව. | වෙන්චුරා ක්‍රිස්ටල් ඉන්වෙස්මන්ට් සමාගම,<br>අංක 485/7, ගුණවර්ධන මාවත, විජේරාම, ගංගොඩවිල,<br>නුගේගොඩ. |
| (21)<br>46522 | ඉලේපෙරුමගේ දොන් හරිත පියුමාල් මයා,<br>අංක 117/B, වලව්වත්ත,<br>මොරොන්තුඩුව. | මල්වත්ත කංකානම්ගේ රවින්ද්‍ර ලලිත් පුෂ්පකුමාර මයා,<br>අංක 49/2, කලපුගම, මොරොන්තුඩුව. |
| (22)<br>46645 | බණ්ඩි හෙට්ටිගේ මධුකා සමන්මලී මිය,<br>අංක 16/7, ජයන්ති මාවත,<br>මිරිහාන, කෝට්ටේ. | පැල්පිට කංකානමලාගේ නිරෝෂන් හේමජිත් මයා,<br>අංක 328/2,<br>හොරගලවත්ත, බෙරකැටිය, කිරිවත්තුඩුව. |
| (23)<br>46725 | වැල්කන්දන ආරච්චිලාගේ ඉසුරු අනුර ජයමාල්,<br>හංවැල්ල, හීන්විට. | බණ්ඩාරනායක වනිගසේකර මුදියන්සේලාගේ එරන්ද අලුවිහාරේ,<br>අංක 487, ශ්‍රී සුමනතිස්ස මාවත, නවගමුව, රණාල. |
| (24)<br>46673 | නාවෙල ගමරාලලාගේ අනුෂ සම්පත් සෝමරත්න,<br>අංක C 27/3, බිබිල ඔය,<br>කිතුල්ගල. | දලුමුර ගමරාලලාගේ දමයන්ති මිය,<br>B 122/02, බිබිල ඔය, කිතුල්ගල. |
| (25)<br>46090 | කත්‍රි ආරච්චිගේ දෝන දේදුණු සිරිවර්ධන මයා,<br>"නන්දන", මඩවලවත්ත, කොළහැකඩ,<br>නඩත්තුඩුව, මතුගම. | කත්‍රි ආරච්චිගේ දොන් චමින්ද නිශාන්ත සිරිවර්ධන මයා,<br>මනාන හංදිය, කොළහැකඩ, නඩත්තුඩුව, මතුගම. |
| (26)<br>46729 | නිරෝෂා ප්‍රියදර්ශනී අතුකෝරල මිය,<br>අංක 339, ලියනගේගම, ආටිගල,<br>හංවැල්ල. | තරුකි ඉන්වෙස්මන්ට් (ප්‍රයි.) ලිමිටඩ්,<br>අංක 179/3, පැලැන් වත්ත, පන්නිපිටිය. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (27)<br>45888 | විල්ලනියගේ සමුද්‍ර නිලුපුල් ද කොස්තා මයා,<br>අංක 437/2A, ජම්බුවත්ත,<br>වනවාසල, කැලණිය. | වික්‍රම ආරච්චිගේ ඉරේෂා මිය,<br>අංක 96/1/B, තිත්තම්පහුව, වැල්ලම්පිටිය. |
| (28)<br>46614 | සේතු හේවා අනුර ද සිල්වා මයා,<br>අංක 291/4, අභයතිස්ස, ඔරුවල,<br>අතුරුගිරිය. | කෝදගොඩ අද්දරගේ නිලානි දමයන්ති මිය,<br>අංක 38/01/10,<br>වැකඩ පාර, මාලපල්ල, හෝමාගම. |
| (29)<br>46657 | බහර්ඩීන් මොහොමඩ් රමීස් මයා,<br>අංක 31/24, දෙවන පටුමඟ,<br>කුරුණියවත්ත,<br>අවිස්සාවේල්ල පාර,<br>වැල්ලම්පිටිය. | වීරපුරගේ නිලූපා ගයානි ප්‍රසන්ගිකා ප්‍රනාන්දු,<br>අංක 07, දෙවන පටුමග, උද්‍යාන පාර, රත්මලාන. |
| (30)<br>46683 | සේරසිංහ විදානගේ චතුරංග නිරංජන් මයා,<br>අංක 489/A/1/1, වැලිහිඳ පාර,<br>යාකාල, කඩුවෙල. | නුවරපක්ෂ දේවයලාගේ උදය ප්‍රසන්න කුමාර මයා,<br>අංක 348/F, විද්‍යාල මාවත, කොතලාවල, කඩුවෙල. |
| (31)<br>46681 | ඉරේෂා ප්‍රිති කුමාරි සිල්වා මිය,<br>අංක 05, අරලිය උයන, මැලැගම,<br>වාද්දුව. | සුදරමා කමණී ඔබේසේකර මිය,<br>අංක 59/4, මහා විහාර පාර, ලක්ෂපතිය, මොරටුව. |
| (32)<br>46632 | හේරත් මුදියන්සේලාගේ දුලීකා මාලි<br>ප්‍රියංගනී මිය,<br>අංක 87/4, දෙමටගොඩ පාර,<br>ගොඩිගමුව, මහරගම. | රෝයල් ගේට් ට්‍රස්ට් ඉන්වෙස්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ්,<br>අංක 65, පුත්තලම් පාර, යන්තම්පලාව, කුරුණෑගල. |
| (33)<br>46741 | කාරියවංශ මහා හෙට්ටිගේ ජනක ප්‍රසාද්<br>ජයසිංහ මයා,<br>පංසල පාර, ඇල්පිටිය,<br>ගොඩකවෙල. | දික්වත්තගේ අනුෂා සෙනෙවිරත්න මිය,<br>පහමුණුපන්න, අටකලන් පන්න. |
| (34)<br>46739 | වාසල තන්ත්‍රිගේ දොන් නන්දන ලාල් මයා,<br>අංක 613/2/B, අරලිය පුරය,<br>ඇරැව්වල, පන්නිපිටිය. | මැදගම ලියනගේ දොන් හරින්ද්‍ර මාරුදන්ත විජිතපාල මයා,<br>අංක 282/5, මෙත්සිරි උයන, ආඩිඅම්බලම, කටුනායක. |
| (35)<br>46684 | කත්‍රි අච්චිගේ ඩෙන්ස්ලි මයා,<br>අංක 19/1/1,<br>යකහලුව, කිරිවත්තුඩුව. | ලක්මාල් ඉන්දික කුමාරගේ මයා,<br>අංක 60E, කොස්වත්ත පාර, කිරිවත්තුඩුව. |
| (36)<br>46686 | සිංහාර මුදලිගේ චන්ද්‍රාවතී පෙරේරා මිය,<br>අංක 510/2, සුස්ලාරාම, මාලබේ. | හේරත් මුදියන්සේලාගේ චතුර නිරෝෂ් දර්ශණ කුමාර් හේරත් මයා,<br>අංක 131, නාවල පාර, කොස්වත්ත, රාජගිරිය. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| (37)<br>46713 | සල්මී මොහොමඩ් ඉරෆාස් නෙයි නිරෝෂා මොහොමඩ් මිය,<br>අංක 56/ඩී, නාතුඩුව, කැළණිය. | පල්ලියමුල්ල කපුගමගේ සුජීව දර්ශන මයා,<br>අංක 20/18, දිවුලවත්ත, නාතුඩුව, කැළණිය. |
| (38)<br>45981 | සුදුවගේ දිනේෂා සුරංගි මිය,<br>අංක 409/2/A, මහගෙදර වත්ත,<br>යග්ගහ, වලහන්දුව, ගාල්ල. | යග්ගහ රුහුනගේ සුමනාවතී මිය,<br>මහගෙදර වත්ත, යග්ගහ, වලහන්දුව. |
| (39)<br>GA 387 | පුවන්දරගේ ජානක අමරවංශ පෙරේරා මයා,<br>"සමාධි" නාරංඕවිට, අවුගොඩ. | අම්බලන්ගොඩ ගුරුන්නාන්සේලාගේ ඉසුරු මාධව පෙරේරා මයා,<br>අංක 54/1/A, කුරුදුවත්ත, වතුගෙදර. |
| (40)<br>GAM 509 | මීමනගේ දිලුපා චතුරි පීරිස් මිය,<br>බොලොස්සගම, කළුතර දකුණ. | හෙයියන්තුඩුවගේ පිලික්ස් රෝෂන් පෙරේරා මයා,<br>අංක 450/F, ඉහළ බියන්විල, කඩවත. |

09-30

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/41/2025/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස්කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2025.09.05** වැනි දින සිට **2025.09.19** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2025.09.26** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**ඩබ්. ආර්. ඒ. එන්. එස්. විජයසිංහ,**
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, ජී කොට්ඨාසයේ, 217 වෙළුමේ, 15 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තු, හේවාගම් කෝරළේ, තලන්ගම පිහිටි "මිල්ලගහ කුඹුර" නමැති ඉඩම සඳහා මායිම්,<br><br>*උතුරට* : කනත්තගේ ලූවිස් පෙරේරාට අයිති වත්ත;<br><br>*නැගෙනහිරට* : කනත්තගේ කුඹුර;<br><br>*දකුණට* : ලොකුකැටගොඩගේ බබා අප්පුට අයිති වත්ත;<br><br>*බස්නාහිරට* : සමරක්කොඩි පෙරකදෝරු මහත්මයාට අයිති කුඹුර.<br><br>*බිම් ප්‍රමාණය* : වී බුසල් 3ක්. | 01. ජේ. විජේවීර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1993.07.17 දින ලියා සහතික කරන ලද අංක 118 දරන විකුණුම් ඔප්පුව. |

09 - 40

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හම්බන්තොට**

ගල්විල පුරාණ රජමහා විහාරය - බිනර මහා පෙරහැර නියෝග

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, උතුර මාගම් පත්තුවේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 121, පහළ බැරගම ග්‍රාමසේවා වසමට අයත් ගල්විල පුරාණ රජමහා විහාරස්ථානයේ, බිනර මහා පෙරහැර මංගල්‍ය නියෝග යනුවෙන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් ජී. සී. ආර්. විජේවර්ධන වන මම, වන්දනාගමන් ආඥාපනත යටතේ රෙගුලාසි බලපවත්නා කාලය වශයෙන් නියම කරමි.

2025 වර්ෂයේ බිනර මහා පෙරහැර මංගල්‍ය **2025.09.11 දින සිට 2025.09.21** දින දක්වා ක්‍රියාත්මක වේ.

ජී. සී. ආර්. විජේවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

09 - 59

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2024 පෙබරවාරි මස 20 වැනි දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත සඳහන්වන යෝජනා සම්මතය විශේෂිතවම සහ ඒකමතිකව සම්මත කරනු ලැබීය.

බෙන්සිල් කලින්ද කන්දේ ගමගේ *හෙවත්* බෙන්සිල් කලින්ද කන්දේගමගේ ණය ගැණුම්කරු වශයෙන් නැෂනල් ඩිවලප්මන්ට් බැන්ක් පී.එල්.සී. (බැංකුව) වාසියට ලියා සකස් කළ හොරණ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. යූ. කේ. ජයවර්ධන විසින් ලියා සහතික කළ 2018.12.28 දිනැති අංක 1370 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කර බැඳ තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර වන ඉඩම සහ පරිශ්‍රයේ සුරැකුම මත පිරිනමන ලද ණය මුදල්/පහසුකම් මත ගෙවීම් පැහැර හැර ඇති හෙයින් ද,

ණය ගැණුම්කරු මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තරවන නිශ්චල දේපළ සහ පරිශ්‍රයේ සින්නක්කර හිමිකරු වශයෙන් අංක 1370 දරන එකී බැඳුම්කරය යටතේ බැංකුව වෙත ඔහුගේ සින්නක්කර අයිතිය, හිමිකම සහ බැඳියාව උකස් කර ඇති හෙයින් ද,

2024 පෙබරවාරි මස 07 වැනි දිනට අංක 1370 දරන එකී උකස් බැඳුම්කරය මත රුපියල් දහඅට මිලියන එකසිය දහනවදහස් තුන්සිය හැත්තෑ පහයි ශත හතළිස් දෙකක (රු. 18,119,375.42) මුදලක් බැංකුව වෙත අයවීමට හිඟව සහ ගෙවිය යුතු බවට පත්ව ඇති හෙයින් ද,

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (මින් මතු එක්ව ගෙන ප්‍රධාන පනත වශයෙන් හඳුන්වනු ලබන) යටතේ තමන් වෙත පැවරී ඇති බලතල යටතේ කටයුතු කරමින් රුපියල් දහඅට මිලියන එකසිය දහනවදහස් තුන්සිය හැත්තෑ පහයි ශත හතළිස් දෙකක (රු. 18,119,375.42) එකී මුදල හෝ විකිණීම අවස්ථාවේ දී නොගෙවා ඉතිරිව පවතින එහි ඕනෑම කොටසක්; සහ

2024 පෙබරවාරි මස 08 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දහතුන් මිලියන තිස් අට දහස් දහනවයයි ශත හතළිස් හයක (රු. 13,038,019.46) අයවීමට හිඟ ප්‍රාග්ධන මුදල මත පොළිය ද, ප්‍රචාරණය කිරීමේ, විකිණීමේ පිරිවැය සහ ප්‍රධාන පනතේ 4 වගන්තිය ප්‍රකාරව උද්ගත වූ අනෙකුත් ගාස්තු ද සමග ඉන් අනතුරුව යම් ගෙවීම් (වෙතොත්) ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා එකී උකස් බැඳුම්කරය මගින් බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර වන දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු එන්. යූ. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසිය මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, අංක 527, නාවින්න ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාව තුළ උඩහමුල්ල පිහිටි "කොට්ටනුව ඔවිට" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් සකස් කළ 2006.05.21 දිනැති අංක 2764 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : තලගහ කුඹුර ද, ශ්‍රී දේවානන්ද පාර වරිපනම් අංක 59/27 දරන පරිශ්‍රය ද; නැගෙනහිරට : ශ්‍රී දේවානන්ද පාර, වරිපනම් අංක 59/27 දරන පරිශ්‍රය ද, මෙහි ලොට් 3 සහ 2 ද; දකුණට : මෙහිම ලොට් 2 සහ ශ්‍රී දේවානන්ද පාර, වරිපනම් අංක 59/25 දරන පරිශ්‍රය ද සහ බටහිරට : ශ්‍රී දේවානන්ද පාර, වරිපනම් අංක 59/25 දරන පරිශ්‍රය සහ තලගහ කුඹුර ද යන මායිම් තුළ පිහිටි එකී අංක 2764 දරන එකී පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම දෙකයි තුනක් (පර්. 15.23) හෝ හෙක්ටෙයාර 0.03852ක් විශාලත්වයෙන් යුත් සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වන අතර, මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B416/62 හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන්වන ඉඩම මතින් සහ ඒ ඔස්සේ මාර්ග රක්ෂිත භාවිත කිරීමට ඇති අයිතිය ද සමග :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, අංක 527, නාවින්න ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහරගම නගර සභා සීමාව තුළ උඩහමුල්ල පිහිටි "කොට්ටනුව ඔවිට" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් සකස් කළ 2006.05.21 දිනැති අංක 2764 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 වශයෙන් ලකුණු කළ (පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : ශ්‍රී දේවානන්ද පාර, වරිපනම් අංක 59/27 දරන පරිශ්‍රය ද; දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ඉඩම ද; නැගෙනහිරට : දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම සහ පාර ද; දකුණට : පාර සහ මෙහිම ලොට් 2 ද සහ බටහිරට : මෙහිම ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි අංක 2764 දරන එකී පිඹුරට අනුව පර්චස් දෙකයි දශම නවයයි එකක් (පර්. 2.91) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටසවන අතර, මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B170/8 හි ලියාපදිංචි කර ඇත.

උපකරණ ද සමග විදුලිබල සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධති උපකරණ, සන්නිවේදන උපකරණ, වායුසමීකරණ උපකරණ ඇතුළුව ඉහත සවිස්තරව සඳහන් එකී ඉඩම් කොටසට දැනට හෝ මින්මතු විටින් විට සවි කරනු ලබන හෝ ස්ථිර ලෙසම සවි කර ඇති නිශ්චල කම්හල යන්ත්‍ර උපකරණ ඇමුණු සවි කිරීම් සහ සේවාවන් ද සියල්ල එක්ව සහ වෙන් වෙන්ව ද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

09-16

## අමානා බැන්ක් පීඑල්සී (PB3618PQ) - කඳුරුවෙල ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද ලියාපදිංචි අංක PB3618PQ යටතේ ලියාපදිංචි වී ඇති පොදු බැංකු සමාගමකි.)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ අමානා බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය.

අමානා බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024.03.16 දින පවත්වන ලද ස්වකීය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය විශේෂයෙන්ම සහ ඒකමතිකව සම්මත කරනු ලැබූ බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තිය යටතේ මෙයින් නිවේදනය කර සිටිනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 486, ගාලු පාර, කොළඹ 03, යන ලිපිනයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තා වූ ද, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කර ඇති සමාගමක් වන ලියාපදිංචි කිරීමේ අංක PB3618PQ දරන අමානා බැන්ක් පීඑල්සී ආයතනය වෙනුවෙන් පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ.එම්.එම්. රාවුෆ් විසින් සහතික කරන ලද 2015.07.09 දින අංක 2169 දරන උකස් බැඳුම්කරයට අදාළව, පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් සී.ඩබ්. එම්. චන්ද්‍රසේකර විසින් සහතික කරන ලද 2017.11.14 දින අංක 31 සහ අංක 33 දරන උකස් බැඳුම්කරවලට අදාළව, 2019.09.12 දින අංක 74 දරන උකස් බැඳුම්කරයට අදාළව, පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ.එම්.එම්. රාවුෆ් විසින් සහතික කරන ලද 2015.07.09 දින අංක 2171 දරන උකස් බැඳුම්කරයට අදාළව, පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් සී.ඩබ්.එම්. චන්ද්‍රසේකර විසින් සහතික කරන ලද 2018.01.24 දින අංක 39 දරන උකස් බැඳුම්කරයට අදාළව, පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් සී.ඩබ්.එම්. චන්ද්‍රසේකර විසින් සහතික කරන ලද 2017.11.14 දින අංක 25 සහ අංක 29 දරන උකස් බැඳුම්කරවලට අදාළව, පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් සී.ඩබ්.එම්. චන්ද්‍රසේකර විසින් සහතික කරන ලද 2017.11.30 දින අංක 36 දරන උකස් බැඳුම්කරයට අදාළව, පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් සී.ඩබ්. එම් චන්ද්‍රසේකර විසින් සහතික කරන ලද 2017.11.14 දින අංක 23 සහ අංක 27 දරන උකස් බැඳුම්කරවලට අදාළව ප්‍රදානය කරන ලද පහසුකම් මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම "බන්ධනදායී" යනුවෙන් හඳුන්වනු ලබන "මොහොමඩ් බෂීර් අහමඩ්" යනුවෙන් ද හඳුන්වනු ලබන "මොහොමඩ් බසීර් අහමඩ්" යන අය විසින් පැහැරහැර ඇති හෙයින් ද; ඉහත කී උකස් බැඳුම්කර මත 2024 ජනවාරි මස 31 දිනය වනවිට දැනට අමානා බැන්ක් පීඑල්සී ආයතනය වෙත රුපියල් මිලියන පන්සිය තිස්එකයි නවලක්ෂ පනස් හත්දහස් දොළහක් වූ මුදලක් (රු. 531,957,012.00) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින්ද; අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩුකිරීමෙන් පසුව ප්‍රචාරක පිරිවැය, දරන ලද වෙනත් යම් පිරිවැය සහ ගාස්තු සමග රුපියල් මිලියන හැත්තෑ පහක්වූ (රු. 75,000,000.00) මුදලක් මත වූ 2024 පෙබරවාරි මස 1 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට 8.69% ක් වූ අනුපාතිකය යටතේ ආයෝජනය/ලාභ/වාරික මත වූ ප්‍රතිලාභය සමග රුපියල් මිලියන හැත්තෑ හතයි දෙලක්ෂ හතළිස් නවදහස් අටසිය හැත්තෑ හයක් වූ (රු. 77,249,876.00) මුදලක් ද, රුපියල් මිලියන දෙසිය පනස් එකයි දෙලක්ෂ හැත්ත හයදහසක් වූ (රු. 251,276,000.00) මුදලක් මත 2024 පෙබරවාරි මස 1 වන දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට AWPLR+2% ක් වූ අනුපාතිකය යටතේ (වර්ෂයකට 13%ක උපරිමයක් සහ වර්ෂයකට 7%ක අවමයක් සහිතව) ආයෝජනය/ලාභ/වාරික මත වූ ප්‍රතිලාභය සමග රුපියල් මිලියන දෙසිය අනූහතරයි හත්ලක්ෂ විසි හයදහස් එකසිය හැටහතරක් වූ (රු. 294,726,164.00) මුදලක් ද, රුපියල් මිලියන තිස්පහයි හැට දෙදහස් දෙසීය අනූදෙකක් වූ (රු. 35,062,292.00) මුදලක් මත 2024 පෙබරවාරි මස 1 දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට AWPLR+2% ක් වූ අනුපාතිකය යටතේ (වර්ෂයකට 13%ක උපරිමයක් සහ වර්ෂයකට 7%ක අවමයක් සහිතව) ආයෝජනය/ලාභ/වාරික මත වූ ප්‍රතිලාභය සමග රුපියල් මිලියන තිස්හයයි පන්ලක්ෂ විසි හයදහස් හයසිය පනස් තුනක් වූ (රු. 36,526,653.00) මුදලක් ද, රුපියල් මිලියන විසිහයයි අටලක්ෂ හැට අටදහස් අටසිය හතළිස් හතරක් වූ (රු. 26,868,844.00) මුදලක් මත 2024 පෙබරවාරි මස 1 වන දින සිට දේපළ වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට AW-PLR+3% ක් වූ අනුපාතිකය යටතේ ආයෝජනය/ලාභය/වාරික මත වූ ප්‍රතිලාභය සමග රුපියල් මිලියන විසිහයයි අට ලක්ෂ හැට අටදහස් අටසිය හතළිස් හතරක් වූ (රු. 26,868,844.00) මුදලක් ද, සහ රුපියල් මිලියන අනූහයයි පන්ලක්ෂ අසූපන්දහස් හාරසිය හැත්ත පහක් වූ (රු. 96,585,475.00) මුදලක් අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2169, 31,33,74, 2171, 39, 25, 29, 36, 23 සහ 27 දරන උකස් බැඳුම්කර මගින් ඉහත කී අමානා බැන්ක් පීඑල්සී ආයතනය වෙත උකස් කරන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති දේපළ, අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර යන ලිපිනයේ පදිංචි බලයලත් වෙන්දේසිකාර නිශාන්ත උපුල් ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් තමා වෙත පැවරී ඇති බලතල යටතේ අමානා බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කර සිටිනු ලැබේ.

### උපලේඛනය

**1 වන දේපළ**

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ, අංක 181, මානික්කම්පට්ටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුස්ලිම් ජනපදය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, මිනුම්පතිවරයා විසින් සකස්කර ඔහුගේ භාරයේ තබන ලද එෆ්.සී.පී. පෝ 151 බීඕපී

දරන පිඹුරේ නිරූපනය කර ඇත්තාවූ ද ජනපද නිලධාරි විසින් සාදන ලද පිඹුරේ ලොට් අංක 146B දරන ඉඩමේ කොටසක් ලෙස ලකුණුකර නිරූපනය කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම නවයයි එකයි එකක් වූ ද (හෙක්ටයාර් 0.911) උතුරට: ලොට් අංක 145 ද; නැගෙනහිරට : ලොට් අංක 143 ද ; දකුණට: ලොට් අංක 135 ද; බටහිරට : ලොට් අංක 146A සහ 145 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, පොළොන්නරුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ LDO/B/42/159 දරන පත්තිරුවේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ඉහත කී ලොට් අංක 146B දරන බෙදා වෙන් කළ ඉඩම් කොටසක් සහ ඒ මත වූ ගොඩනැගිලි, අස්වැන්න, වගාවන් සහ වෙනත් සියලු දේද වේ.

ඉහත කී ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු ඩබ්.ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2013.02.24 දින අංක W/84/13 දරන පිඹුරක් මගින් නැවත මැන පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත. එනම් :

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ, අංක 181, මානික්කම්පට්ටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුස්ලිම් ජනපදය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, එෆ්.සී.පී. පෝ 151 දරන පිඹුරේ ලොට් 146 හි කොටසක් ලෙස (B.O.D. ජනපද නිලධාරි විසින් සකස් කළ පිඹුරේ ලොට් 146B) ලකුණුකර නිරූපනය කර ඇත්තා වූ ද බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2013.02.24 දින W/84/13 දරන පිඹුරේ "ලොට් අංක 01" ලෙස ලකුණුකර ඇත්තා වූ ද "කිරයනකාඩු වෙට්ටු" යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම නවයයි එකයි එකක් වූ ද (හෙක්ටයාර් 0.911) උතුරට : එෆ්.සී.පී. පෝ 151 පිඹුරේ ලොට් අංක 145 ද, නැගෙනහිරට : එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 145 සහ 146 මෙන්ම ඉහත කී පිඹුරේ ලොට් අංක 3 ද; දකුණට : එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 135 ද; බටහිරට : එෆ්.සී.පී. පෝ. 151 පිඹුරේ ලොට් අංක 35 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ඉහත කී "ලොට් අංක 01" දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි, අස්වැන්න, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

ඉඩමට සහ පරිශ්‍රයට සවිකර ඇති පහත සඳහන් යන්ත්‍රෝපකරණ ද එයට ඇතුළත් වේ; එනම් -

| *අංකය* | *යන්ත්‍රෝපකරණයේ නම* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01 | ෂිෆ්ටර් සහ ඩස්ට් ෆෑන් යන්ත්‍රය | 02 |
| 02 | බොයිලේරුව - විශේෂ | 01 |
| 03 | විදුලි සෝපානය | 28 |
| 04 | ස්ටෝනර් යන්ත්‍රය | 04 |
| 05 | ජෙට් පොලිෂර් යන්ත්‍රය | 04 |
| 06 | 120 පොලිෂර් යන්ත්‍රය | 01 |
| 07 | වෙන්කිරීමේ යන්ත්‍රය | 02 |
| 08 | දූවිලි වෙන්කිරීමේ යන්ත්‍රය | 01 |
| 09 | ජෙට් හලර් යන්ත්‍රය | 04 |
| 10 | හලර් යන්ත්‍රය (එක්වරක්) | 04 |
| 11 | සුදු සහල් වර්ග කිරීමේ යන්ත්‍රය | 03 |
| 12 | වියලනය | 01 |
| 13 | ඩස්ට් ෆෑන් යන්ත්‍රය | 06 |
| 14 | බ්‍රයර් ටවර් යන්ත්‍රය | 01 |
| 15 | ගබඩා ටැංකිය | 01 |
| 16 | පද්ධතිය සමග පැනල් පුවරුව | 01 |
| 17 | ජල ප්‍රතිකාරක යන්ත්‍රාගාරය | 01 |

**2 වන දේපළ**

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය සහා සීමාව ඇතුළත, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ අංක 186 - කඳුරුවෙල නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මුස්ලිම් ජනපදය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "කඳුරුවෙල දමන කැලේ" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2017.11.24 දින අංක WA/1494/17 දරන පිඹුරේ "ලොට් අංක 02" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : මෙම පිඹුරේ ලොට් අංක 01 සහ එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 09 සහ ලොට් අංක 365 ද; නැගෙනහිරට : එෆ්. සී.පී.පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 365 සහ ලොට් අංක 38 ද; දකුණට : එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 38 හා මෙම පිඹුරේ ලොට් අංක 03 ද, බටහිරට : මෙම පිඹුරේ ලොට් අංක 03 සහ එෆ්.සී.පී.පෝ 151 දරන පිඹුරේ ලොට් අංක 38 සහ ලොට් අංක 364 දරන ඉඩමේ කොටසක් ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් බිංදුවයි පර්චස් නවයයි දශම එකයි පහක් (අ:1, පර්: 9.15) *හෙවත්* හෙක්ටයාර් බිංදුවයි දශම හතරයි තුනයි දෙකක් වූ ද (හෙක්ටයාර් 0.432) පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ B08/119 දරන හිමිකම යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් අංක 02 දරන ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

**3 වන දේපළ**

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, පොළොන්නරුව ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ, කඳුරුවෙල මුස්ලිම් ජනපදය ග්‍රාමයේ, පිහිටා ඇත්තා වූ ද, "කඳුරුවෙල දමන කැලේ" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ගුණතිලක විසින් සාදන ලද 2003.08.02 දින අංක 2223 දරන පිඹුරේ "ලොට් අංක 01" ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූද, උතුරට : බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ගුණතිලක විසින් සාදන ලද 2003.08.02 දින අංක 2222 දරන පිඹුරේ ලොට් අංක 04 ද; නැගෙනහිරට : අංක 2222 දරන පිඹුරේ ලොට් අංක 03 සහ ලොට් අංක 10 ද; දකුණට :

අංක එෆ්.සී.පී. පෝ 151 දරන පිඹුරේ ලොට් අංක 174 ද; බටහිරට: අංක 2222 දරන පිඹුරේ ලොට් අංක 05 සහ ලොට් අංක 06 ද, යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් දෙකක් වූ ද (රූ:2) පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ LDO/B/35/02 දරන හිමිකම යටතේ ලියාපදිංචි වී ඇති ඉහත කී "ලොට් අංක 01" දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2015.01.05 දින අංක 688/14 දරන පිඹුරක් මගින් නැවත මැන එකී අංක 688/14 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩම් කොටස පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත. එනම් -

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ 74A - කදුරුවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුස්ලිම් ජනපදය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "කදුරුවෙලදමනකැලේ" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2015.01.05 දින අංක 688/14 දරන පිඹුරේ "ලොට් අංක 01" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට: බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ගුණතිලක විසින් සාදන ලද 2003.08.02 දින අංක 2222 දරන පිඹුරේ ලොට් අංක 04 ද; නැගෙනහිරට : ඉහත කී අංක 2222 දරන පිඹුරේ ලොට් අංක 03 සහ ලොට් අංක 10 ද; දකුණට : අංක එෆ්. සී. පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 174 ද; බටහිරට:- ඉහත කී අංක 2222 දරන පිඹුරේ ලොට් අංක 05 සහ 06 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් දෙකක් වූ ද (රූ:2) ඉහත කී ලොට් අංක 01 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

**4 වන දේපළ**

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, පොළොන්නරුව ලියාපදිංචි කොට්ඨාසයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ 184 - කදුරුවෙල දකුණ ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ, කදුරුවෙල මුස්ලිම් ජනපදය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "කදුරුවෙල දමන කැලේ" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සාදන ලද 1996.07.23 දින අංක 1483P දරන පිඹුරේ "ලොට් අංක 07" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : එෆ්.සී.පී. පෝ 151 දරන පිඹුරේ ලොට් අංක 174 සහ අංක 1483 පී. දරන පිඹුරේ ලොට් අංක 03 ද; නැගෙනහිරට : එෆ්. සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 174 ද; දකුණට : අංක එෆ්. සී. පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 174 ද; බටහිරට : එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 174 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දාසයයි දශම එකක් වූ ද (රූ:3, පර්:16.1) LDO/B/34/190 දරන හිමිකම යටතේ පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් අංක 07 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු ඩබ්.ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2014.03.09 දින අංක W/35/14 දරන පිඹුර මගින් ඉහත කී ඉඩම නැවත මැන එකී අංක W/35/14 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩම් කොටස පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත. එනම් :-

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, පොළොන්නරුව ලියාපදිංචි කොට්ඨාසයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ 184 - කදුරුවෙල දකුණ ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ, මුස්ලිම් ජනපදය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "කදුරුවෙල දමන කැලේ" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2014.03.09 දින අංක W/35/14 දරන පිඹුරේ "ලොට් අංක 01" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට :1483පී දරන පිඹුරේ ලොට් අංක 03 සහ ලොට් අංක 04 මෙන්ම අංක එෆ්.සී.පී. පෝ 151 දරන පිඹුරේ ලොට් අංක 174 ද; නැගෙනහිරට: අංක එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 174 ද; දකුණට: අංක එෆ්. සී. පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 174 ද; බටහිරට: අංක එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 174 සහ අංක 1483පී දරන පිඹුරේ ලොට් අංක 06, 03 සහ 04 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දාසයයි දශම එකක් (රූ:3 පර්:16.1) *හෙවත්* හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි හතරයි හතරක් (හෙක්ටයාර් 0.344) වූ ද ඉහත කී ලොට් අංක 01 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

**5 වන දේපළ**

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ 184 - කදුරුවෙල දකුණ ග්‍රාමනිලධාරි කොට්ඨාසයේ, මුස්ලිම් ජනපදය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, මිනුම්පතිවරයා විසින් සාදන ලද එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 686 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 687 ද; නැගෙනහිරට : ඉහත කී අංක එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 165 ද; දකුණට : අංක එෆ්. සී. පී. පෝ 151 දරන පිඹුරේ ලොට් අංක 174 සහ 687 ද; බටහිරට: අංක එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 687 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි තුනයි එකයි හයක් වූ ද (හෙක්ටයාර් 0.1316) පොළොන්නරුව දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ LDO/B 35/01 දරන හිමිකම යටතේ ලියාපදිංචි වී ඇත්තා වූ ද, ලොට් අංක 686 දරන ඉහත කී බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු ඩබ්.ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2015.01.05 දින අංක 689/14 දරන පිඹුරක් මගින් ඉහත කී ඉඩම

නැවත මැන එකී අංක 689/14 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩම් කොටස පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත. එනම් :-

උතුරුමැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුවේ 184 - කදුරුවෙල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මුස්ලිම් ජනපදය ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද, "කදුරුවෙල දමන කැලේ" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ප්‍රේමරත්න විසින් සාදන ලද 2015.01.05 දින අංක 689/14 දරන පිඹුරේ "ලොට් අංක 01" ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට: අංක එෆ්.සී.පී. පෝ 151 දරන පිඹුරේ ලොට් අංක 687 ද; නැගෙනහිරට : අංක එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 165 ද; දකුණට : අංක එෆ්. සී. පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 174 සහ 687 ද; බටහිරට : එෆ්.සී.පී. පෝ. 151 දරන පිඹුරේ ලොට් අංක 687 ද යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දොළහයි දශම බිංදුවයි තුනක් (රූ:1 පර්:12.03) *හෙවත්* හෙක්ටයාර් බිංදුවයි දශම එකයි තුනයි එකයි හයක් වූ ද (හෙක්ටයාර් 0.1316) ඉහත කී ලොට් අංක 01 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස සහ ඒ මත වූ වෙනත් සියලු දේ ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය ප්‍රසිද්ධ කරනු ලබන අවස්ථාවේ දී ඉහත කී අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයට අත්සන් කිරීම සඳහා අමානා අමනා බැංක් පී.එල්.සී ආයතනයේ අයකිරීම් කළමනාකරණ ප්‍රධාන රීසා ඉස්මායිල් බලය පැවරීමට ද තවදුරටත් යෝජනා සම්මත කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

රීසා ඉස්මායිල්,
අයකිරීම් කළමනාකරණ - ප්‍රධානී.

09-42

---

**සෙලාන් බැන්ක් පී. එල්. සී. - ගම්පොළ ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත.)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන්නට යෙදුණු යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.08.26 වැනි දින පැවති රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගිණුම් අංකය : 0250-12740535-001

"කවිඳු බිල්ඩර්ස්" යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරිකයකු වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ගජනායක මුදියන්සේලාගේ කවිඳු චන්දික ගජනායක සහ මහනුවර පදිංචි මීතලාවේ අලුත්ගමගේ අයෝමි අප්සරා මීතලාව "බැඳුම්කරුවන්/උකස්කරුවන්" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් මහනුවර හිමිකම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි කර ඇති ප්‍රසිද්ධ නොතාරිස් ඈන් මෙලනි ද ලීමා විසින් ලියා සහතික කළ 2017.02.06 දිනැති දිනපොත් අංක 36/210 යටතේ හිමිකම් සහතික අංක 00362504695 හි ලියාපදිංචි කළ උකස් ලියවිල්ල ද 2017 පෙබරවාරි 03 දිනැති දිනපොත් අංක 36/201 ද, 2018.08.18 දිනැති දිනපොත් අංක 36/1185 ද සහ 2018.01.17 දිනැති දිනපොත් අංක 36/80 ද යටතේ හිමිකම් සහතික පත් අංක 00362508742 හි ලියාපදිංචි කළ උකස් ලියවිලි ද, 2018.01.17 දිනැති දිනපොත් අංක 36/81 යටතේ හිමිකම් සහතික අංක 00362529635 හි ලියාපදිංචි උකස් ලියවිල්ල ද, 2019.10.28 දිනැති දිනපොත් අංක 36/1674 යටතේ හිමිකම් සහතික අංක 00362504930 හි ලියාපදිංචි උකස් ලියවිල්ල ද, මත අයවීමට ඇති ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එකී උකස් ලියවිලි මත පහත සඳහන් වන පරිදි වන පහසුකම් මත ප්‍රාග්ධන මුදල සහ 2024.11.06 දින දක්වා පොළිය වශයෙන් රුපියල් හැත්තෑහත් මිලියන දෙසිය හැටහතර දහස් හත්සිය අසූවයි ශත අනූඑකක (රු. 77,264,780.91) එකතු වූ මුදලක් සහ පොළිය සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් හැත්තෑහත් මිලියන දෙසිය හැටහතර දහස් හත්සිය අසූවයි ශත අනූඑකක (රු. 77,264,780.91) එකී මුදල ද එම සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය දක්වා 2024 නොවැම්බර් මස 07 වැනි දින සිට පහත සඳහන් පරිදි පොළිය ද එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණ පිරිවැය ද වෙනත් ඕනෑම ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ එකී උකස් ලියවිලි මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකිණීමට බලයලත් වෙන්දේසිකරු තුසිත කරුණාරත්න විසින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) එකී අයිරා පහසුකම සම්බන්ධයෙන් බැංකුව වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති මුළු මුදල 2024 නොවැම්බර් මස 06 දිනට රුපියල් නව මිලියන දෙසිය අනූඑක්දහස් එකසිය හැත්තෑ හතරයි ශත තිස්පහක (රු. 9,291,174.35) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2024.11.07 වැනි දින සිට

වාර්ෂිකව සියයට විසි අට (28%) බැගින් පොළිය ද සමගවන බවට ප්‍රකාශ කිරීමට මා වෙත තවදුරටත් උපදෙස් ලැබී ඇත.

(ආ) රු. 65,058,000.00 ක එකී කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2024.11.06 දිනට රුපියල් හැටහත් මිලියන නවසිය හැත්තෑ තුන්දහස් හයසිය හයයි ශත පනස් හයක (රු. 67,973,606.56) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2024.11.07 වැනි දින සිට වාර්ෂිකව සියයට විසිදෙක (22%) බැගින් රුපියල් හැටඑක් මිලියන හාරසිය විසිඅට දහසක (රු. 61,428,000.00) මුදල මත වැඩිදුර පොළිය ද සමග.

### පළමු උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 41, වැලිගල්ල සහ අංක 45, දෙල්ගහපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොල්ගහඅන්ග ග්‍රාමයෙහි පිහිටි, ඉඩමට මැනුම්පති විසින් සහතික කළ අංක 320240 දරන කැඩැස්තර සිතියමෙහි නිරූපිත ලොට් 60 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 59 කැබැල්ල ද; නැගෙනහිරට : ලොට් 11 කැබැල්ල ද; දකුණට : ලොට් 61 කැබැල්ල ද සහ බටහිරට : ගම්පොළ සිට පේරාදෙණිය දක්වා දිවෙන පාර ද යන මායිම් තුළ පිහිටි අංක 320240 දරන එකී කැඩැස්තර සිතියමට අනුව හෙක්ටෙයාර 0.0129ක ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගහකොළ, වගාවන් සහ සියලු දේද සමග වන්නේ ය.

ප්‍රසිද්ධ නොතාරිස් ඈන් මෙලනි ද ලීමා විසින් ලියා සහතික කළ 2017.02.06 දිනැති දිනපොත් අංක 36/210 යටතේ හිමිකම් සහතික අංක 00362504695 හි ලියාපදිංචි කළ උකස් ලියවිල්ල යටතේ උකස් කළ දේපළ.

### දෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමා තුළ අංක 41, වැලිගල්ල සහ අංක 45, දෙල්ගහපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොල්ගහඅන්ග ග්‍රාමයෙහි පිහිටි, ඉඩමට මැනුම්පති විසින් සහතික කළ අංක 320240 දරන කැඩැස්තර සිතියමෙහි නිරූපිත ලොට් 0056 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 55 සහ 11 දරන කැබලි ද; නැගෙනහිරට : ලොට් 11 කැබැල්ල ද; දකුණට : ලොට් 57 සහ 11 දරන කැබලි ද සහ බටහිරට : ගම්පොළ සිට පේරාදෙණිය දක්වා දිවෙන පාර ද යන මායිම් තුළ පිහිටි අංක 320240 දරන එකී කැඩැස්තර සිතියමට අනුව හෙක්ටෙයාර 0.0758ක ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගහකොළ, වගාවන් සහ සියලු දේද සමග වන්නේ ය.

ප්‍රසිද්ධ නොතාරිස් ඈන් මෙලනි ද ලීමා විසින් ලියා සහතික කළ 2017.02.03 දිනැති දිනපොත් අංක 36/201, 2017.08.18 දිනැති දිනපොත් අංක 36/1185 සහ 2018.01.17 දිනැති දිනපොත් අංක 36/80 යටතේ හිමිකම් සහතික අංක 00362508742 හි ලියාපදිංචි කළ උකස් ලියවිල්ල යටතේ උකස් කළ දේපළ.

### තුන්වන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමා තුළ අංක 44, පොල්ගහ අංග ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොල්ගහන්ග ග්‍රාමයෙහි පිහිටි, ඉඩමට මිනුම්පති විසින් සහතික කළ අංක 320240 දරන කැඩැස්තර සිතියමෙහි නිරූපිත ලොට් 322 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 321 කැබැල්ල සහ ඇළ ද; නැගෙනහිරට: ඇළ ද; දකුණට : ලොට් 56 කැබැල්ල සහ බටහිරට : ගෙලිඔය සිට පේරාදෙණිය දක්වා දිවෙන ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි හෙක්ටෙයාර 0.0478 ක ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේද සමග වනනේ ය.

2018.01.17 දිනැති දිනපොත් අංක 36/81 යටතේ හිමිකම් සහතික අංක 00362529635 හි ලියාපදිංචි උකස් ලියවිල්ල යටතේ උකස් කළ දේපළ.

### හතරවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමා තුළ අංක 41, වැලිගල්ල සහ අංක 45 දෙල්ගහපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොල්ගහඅන්ග ග්‍රාමයෙහි පිහිටි, ඉඩමට මැනුම්පති විසින් සහතික කළ අංක 320240 දරන කැඩැස්තර සිතියමෙහි නිරූපිත ලොට් 0057 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරු නැගෙනහිරට : පාර සහ මායිම් තාප්පය ද; දකුණු නැගෙනහිරට : ලොට් 11 කැබැල්ල ද; දකුණු බටහිරට : ලොට් 58 කැබැල්ල ද සහ උතුරු බටහිරට : පාර ද (මා.ස.අ.) යන මායිම් තුළ පිහිටි හෙක්ටෙයාර 0.0347ක ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේද සමග වන්නේ ය.

2019.10.28 දිනැති දිනපොත් අංක 36/1674 යටතේ හිමිකම් සහතික අංක 00362504930 හි ලියාපදිංචි කළ උකස් ලියවිල්ල යටතේ උකස් කළ දේපළ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

09 - 36/1

**සෙලාන් බැන්ක් පී. එල්. සී. - කිරිබත්ගොඩ ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත.)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන්නට යෙදුණු යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.08.26 වැනි දින පැවති රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගිණුම් අංකය : 0060-34455400-001

ලියාපදිංචි අංක PV 86700 දරන, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සහ කිරිබත්ගොඩ තම ලියාපදිංචි කාර්යාලය සහිත සමාගමක් වන ස්මැක් සේරා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම සහ කිරිබත්ගොඩ පදිංචි රත්නගොඩ බරනදුගේ සංජීව පුෂ්ප කුමාර ප්‍රිය චන්ද්‍රසිරි "බැඳුම්කරු/ උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් සංජීවනි කේ. වීරසිංහ විසින් ලියා සහතික කළ 2021.03.02 දිනැති අංක 591 දරන උකස් බැඳුම්කරය මත කාලීන ණය මුදල I පහසුකම සම්බන්ධනේ අයවීමට ඇති ගෙවීම් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය මත ප්‍රාග්ධන මුදල සහ 2025.07.22 දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්හතර මිලියන නවසිය හතළිස්අට දහස් හාරසිය තිස්පහයි ශත දහසයක (රු. 54,948,435.16) මුදලක් ද, 2025.06.23 දින සිට වාර්ෂිකව සියයට දහතුනයි දශම පහ (13.5%) බැගින් රුපියල් පනස්හතර මිලියන එකසිය පනස් හයදහස් දෙසිය හැටනවයයි ශත හැටඅටක (රු. 54,156,269.68) මුදල මත පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් පනස්හතර මිලියන නවසිය හතළිස්අට දහස් හාරසිය තිස්පහයි ශත දහසයක (රු. 54,948,435.16) එකී මුදල ද එය සම්පූර්ණයෙන් අයකර ගන්නා දිනය තෙක් 2025 ජූලි 23 දින සිට ඉහත කී පරිදි පොළිය ද එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණ පිරිවැය ද වෙනත් ඕනෑම ගාස්තු ද සමග, ඉන් අනතුරුව ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 591 දරන උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකිණීමට බලයලත් වෙන්දේසිකරු වන තුසිත කරුණාරත්න වෙත බලය පවරනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලබයි.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කොළඹ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය (දැනට ගම්පහ) තුළ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවෙහි, කැලණිය ප්‍රාදේශීය සභා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 266ඒ, කෙන්දගහේන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තලවතුහේන්පිට ග්‍රාමයන්හි පිහිටි ගොරකගහවත්ත සහ මිල්ලගහවත්ත *හෙවත්* හොරකගහවත්ත සහ මිල්ලගහඔවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එම්. කේ. පෙරේරා විසින් සකස් කළ 2020.11.26 දිනැති 2025.11.25 දින මැන සකස් කළ අංක 1253 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : කේ. ඩබ්ලිව්. පෙරේරා සහ තවත් අයට සහ කේ. ඩී. පෙරේරා සහ තවත් අයට අයිති ඉඩම ද; නැගෙනහිරට: කේ. ජී. පෙරේරා සහ තවත් අයට අයිති ඉඩම සහ අංක 3705 දරන පිඹුරේ ලොට් 6 කැබැල්ලෙහි ඉතිරි කොටස ද; දකුණට : අංක 3705 දරන පිඹුරේ ලොට් 6 කැබැල්ලේ ඉතිරි කොටස සහ පාතිමා පාර සහ කේ. එස්. පෙරේරාගේ උරුමකරුවන්ගේ ඉඩම ද සහ බටහිරට: පාතිමා පාර ද, කේ. එස්. පෙරේරාගේ උරුමකරුවන්ගේ ඉඩම ද සහ අංක 3705 දරන පිඹුරේ ලොට් 1 කැබැල්ලේ ඉතිරි කොටස ද සහ කේ. ඩබ්ලිව්. පෙරේරා සහ තවත් අයගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි සම්පූර්ණ ඉඩම් කොටස දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු චංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවි කිරීම් හෝ ඉදි කිරීම් ද සමග රූඩ් දෙකයි පර්චස් පහළොවක (රූ.2, පර්. 15) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේද සමග වන්නේ ය.

ඉහත එකී ලොට් 1 කැබැල්ල බලයලත් මිනින්දෝරු අයි. ගුණසේකර විසින් සකස් කළ 2012.07.09 දිනැති අංක 5089 දරන පිඹුරේ නිරූපිත ලොට් A වශයෙන් ලකුණු කළ ඉඩමේ නැවත මැනුමක් වන්නේ ය.

ඉහත අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය ප්‍රසිද්ධ කරනු ලබන අවස්ථාවේ අත්සන් කිරීමට සෙලාන් බැන්ක් පී.එල්.සී. හි සහකාර සමානාධිකාරි නීති, නීතිඥ, වී. ඒ. පරණගම වෙත බලය ලබා දෙන බවට ද තවදුරටත් යෝජනා සම්මත කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති.

09 - 36/2

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ගෝල්ඩන් අයිල් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංකය : 0032 1000 6485.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.06.25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ජේ. සී. ආර්. රත්ගම අය විසින් ලියා සහතික කරන ලද 2017 ජුනි මස 01 දාතම හා අංක 1839 සහ ඒ. ඩබ්. එස්. කල්හාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2023 පෙබරවාරි මස 13 දාතම හා අංක 6016 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 2214 දරන ශ්‍රී ලංකා සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන ගෝල්ඩන් අයිල් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර ඇති හෙයින් ද,

එකී අංක 1839 සහ 6016 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහනව කෝටි හැට පන් ලක්ෂ අසූ තුන් දහස් හැත්තෑ හයයි ශත හතළිස් හයක (රු. 196,583,076.46) මුදලක්, 2025 අප්‍රේල් මස 07 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහනව කෝටි හැට පන් ලක්ෂ අසූ තුන් දහස් හැත්තෑ හයයි ශත හතළිස් හයක (රු. 196,583,076.46) මුදල ද, 2025 අප්‍රේල් මස 08 වැනි දින සිට අංක 1839 සහ 6016 උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහසය කෝටි දස දහස් හත්සිය හැට හයයි ශත හැට එකක (රු. 160,010,766.61) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුව (15.50%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුව ඇති වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1839 සහ 6016 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර කඳුපළාත කෝරළේ, උඩුනුවර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පානබොක්ක ග්‍රාමනිලධාරි කොට්ඨාසය තුළ පානබොක්ක ග්‍රාමයේ පිහිටි "වලව්වේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එස්. එම්. අස්වර්ඩ් යන අය විසින් සාදන ලද 2006 අගෝස්තු මස 12 දාතම හා අංක 4545 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඇළ සහ හේරත්ට අයත් දෙනියකුඹුර; නැගෙනහිරට : පාර අංක 4545 දරන එකී පිඹුරේ ලොට් 2; දකුණට : වට්ටපොල සිට බඹරදෙනිය දක්වා පාර ආර්. ජී. පානබොක්කේ යන අයට අයත් ඉඩම බබානිස්ට අයිති මඩුකන්දේ වත්ත තේ සහ මෙම පිඹුරේ ලොට් 4 සහ 5 සහ බස්නාහිරට : ඇළ, හේරත්ට අයත් දෙනියකුඹුර ඉවුර (Bank) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකක් (A:2) විශාල ඉඩම් කොටස සහ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4545 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව C 487/183 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර කඳුපළාත කෝරළේ, උඩුනුවර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, උඩුනුවර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පානබොක්ක ග්‍රාමනිලධාරි කොට්ඨාසය තුළ පානබොක්ක ග්‍රාමයේ පිහිටි "වලව්වේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එස්. එම්. අස්වර්ඩ් යන අය විසින් සාදන ලද 2006 අගෝස්තු මස 12 දාතම හා අංක 4545 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ප්‍රධාන පාරේ සිට පනාබොක්ක දක්වා පාර (ප්‍රාදේශීය සභා) නිවැරදිව ඇළ; ඊසානට: එකී පිඹුරේ ලොට් 3; නැගෙනහිරට: නිවස දක්වා අඩිපාර (ප්‍රාදේශීය සභා); ගිනිකොණට : එකී පිඹුරේ ලොට් 4 සහ 5 සහ ඩී. ජී. බබානිස්ගේ උඩකන්දේවත්ත තේ වෙන් කරන කම්බි සහ පැළඉණි වැට; නිරිතට : එකී පිඹුර ලොට් 4 සහ පැළඉණි වැට; බස්නාහිරට : මෙම පිඹුරේ ලොට් 1 සහ වයඹට: ඇල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දෙකයි රූඩ් දෙකයි පර්චස් දහහතර (A:2, R:2, P:14) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4545 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව C 519/41 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 සහ ලොට් 2 හි කොටසක් ඒකාබද්ධ කොට නැවත මැන ඇති අතර එය පහතින් නිරූපණය වේ :

එකී පානබොක්ක පිහිටි "වලව්වේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එන්. සේනාරත්න යන අය විසින් සාදන ලද 2017 මැයි මස 22 සහ 24 දාතම හා අංක 2155 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: ඇළ සහ ප්‍රාදේශීය සභා පාර සහ ලොට් 2; නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර සහ උඩකන්දේවත්ත; දකුණට : අංක 4545 පිඹුරේ ලොට් 4 සහ 5 ආර්. ජී. පානබොක්ක යන අයට අයත් ඉඩම සහ මහ පාර සහ බස්නාහිරට : ඇළ සහ බලයලත් මානක එන්. සේනාරත්න යන අය විසින් සාදන ලද අංක 2063 පිඹුරේ ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර හතරයි රූඩ් දෙකයි පර්චස් දහතුනයි දශම දෙකයි පහක් (A:4, R:2, P:13.25) විශාල ඉඩම් කොටස සහ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2155 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුව C 519/127 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

09 - 52

## ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

### උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2025 වර්ෂය** | | | |
| **සැප්තැම්බර්** | 2025.09.04 | බ්‍රහස්පතින්දා | 2025.08.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.12 | සිකුරාදා | 2025.08.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.09.19 | සිකුරාදා | 2025.09.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2025.09.26 | සිකුරාදා | 2025.09.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2025.10.03 | සිකුරාදා | 2025.09.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.10 | සිකුරාදා | 2025.09.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.17 | සිකුරාදා | 2025.10.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.24 | සිකුරාදා | 2025.10.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.10.31 | සිකුරාදා | 2025.10.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2025.11.07 | සිකුරාදා | 2025.10.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.14 | සිකුරාදා | 2025.10.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.21 | සිකුරාදා | 2025.11.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.11.28 | සිකුරාදා | 2025.11.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජුනි මස 09 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.